CENTRE FOR POLICY ALTERNATIVES
විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය
மாற்றுக் கொள்கைகளுக்கான நிலையம்

## අතුරුදහන් වු තැනැත්තන් පිළිබඳව වු කාර්යාලය (OMP) ක්‍රියාත්මක කිරීමේ ක්‍රියාදාමය කෙරෙහී විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය සැලැකිලිමත් වෙයි

***2017 සැප්තැම්බර් 13 වැනි දින, කොළඹ, ශ්‍රී ලංකාවඃ*** ජනාධිපති මෛතීපාල සිරිසේන මහතා විසින් ජාතික එකාබද්ධතාවය සහ සංහිඳියාව පිළිබඳ අමාත්‍යවරයා වශයෙන් 2017 සැතැම්බර් 12 දින දරණ අංක 2036/21 (අතිවිශේෂ) ගැසට් පත්‍රය නිකුත් කිරීම පිළිබඳව විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය සිය බරපතල සැලැකිලිමත් භාවය පලකොට සිටී. මීට පෙර ජනාධිපති සිරිසේන මහතා විසින් 2016 අංක 14 දරණ (අතුරුදහන් වු තැනැත්තන් පිළිබඳව වු කාර්යාලය (පිහිටුවීම, පරිපාලනය කිරීම හා කර්තව්‍යයන් ඉටු කිරීම) පනත (අතුරුදහන් වු තැනැත්තන් පිළිබඳ වු කාර්යාල පනත ) ජාතික එකාබද්ධතාවය සහ සංහිඳියාව පිළිබඳ අමාත්‍යවරයාට පවරමින් 2028/45 (අතිවිශේෂ) ගැසට් පත්‍රය නිකුත් කල විටද විකල්ප ප්‍රතිපත්ති කෙන්ද්‍රය විසින් තම සැළැකිලිමත් භාවය පල කොට සිටීමට යෙදිනි.

විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ මුල් ප්‍රකාශය මගින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 19 වන සංශෝධනයේ ප්‍රකාරව අමාත්‍යංශවල විෂයයන් සහ ක්‍රියාකාරීත්වයන් පැවැරීම පිළිබඳව වු ප්‍රධාන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාමය කරුණක් ඉස්මතු කිරීමට යෙදිනි. එසේ අප පෙන්වා දුන් පරිදි, 19 වන සංශෝධනයට පෙර වෙනත් කැබිනට් අමාත්‍යවරයකු හට පවරනු නොලැබු ඕනෑම විෂයයක් හෝ ක්‍රියාකාරකමක් තමන් වෙත පවරා ගැනීමට ජනාධිපතිවරයාට බලය තිබිනි. 19 වන සංශෝධනය මගින් මෙම ප්‍රතිපාදනය ඉවත්කරනු ලැබිණි. කෙසේ නමුත් 19 වන සංශෝධනය ක්‍රියාත්මක වීම ඇරඹෙන දිනයේ ජනාධිපති ධූරය දරණ පුද්ගලයා සඳහා මෙහිදී විශේෂ ව්‍යතිරේකයක් ඇති කරනු ලැබිනි. 2015 අගෝස්තු මහ මැතිවරණයෙන් පසු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 43(2) ව්‍යවස්ථාව ප්‍රකාරව ජනාධිපතිවරයා විසින් ගැසට් පත්‍ර 2 ක් නිකුත් කරමින් පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට අමාත්‍යංශ භාරවන සේ පත්වීම් සිදු කිරීමට යෙදිනි. ඉන්පසුව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 43(1) ව්‍යවස්ථාව ප්‍රකාරව ජනාධිපතිවරයා විසින් 2015 සැප්තැම්බර් 21 දින දරන 1933/13 (අතිවිශේෂ) ගැසට් පත්‍රය නිකුත් කරමින් ඊට පෙර බෙදා වෙන් කරන ලද අමාත්‍යංශවලට අදාල විෂයයන් සහ ක්‍රියාකාරකම් පැවැරීමට යෙදිනි. වැඩිදුරටත් මෙම ගැසට් පත්‍රය (2015 සැප්තැම්බර් 21 දිනැති 1933/13) මගින් ''ජාතික එකාබද්ධතාවය සහ සංහිඳියාව පිළිබඳව වු අමාත්‍යංශය''ක් පිහිටුවනු ලැබු අතර එය කිසිඳු පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු හට වෙන්කරනු ලැබ නොතිබිනි. කෙසේ නමුත් 19 වන සංශෝධනයේ 51 වන ඡේදයේ නිශ්චිත ලෙස දක්වා ඇති විෂයන් සහ ක්‍රියාකාරකම් වලින් බාහිරව කිසිඳු විෂයක් හෝ ක්‍රියාකාරකමක් තමන් වෙත පවරා ගැනීමට ජනාධිපති වරයාට බලයක් නොමැත. එබැවින් ජාතික ඒකිබද්ධතාවය හා සංහිඳියාව පිළිබඳව වන ඇමැතිවරයාගේ බලතල ජනාධිපතිවරයාට පවරනු ලැබු 2015 සැප්තැම්බර් 21 වන දිනැති 1933/13 (අති විශේෂ) ගැසට් පත්‍රයේ කොටස් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට පටහැනි වේ. මේ අනුව, 2017 ජුලි සහ සැප්තැම්බර් මාසවල නිකුත් කරන ලද ගැසට් පත්‍ර දෙක පිළිබඳව ප්‍රශ්ණ මතු වේ. මෙයින් දෙවැන්න ජාතික ඒකාබද්ධතාවය හා සංහිඳියාව භාර අමාත්‍යවරයාගේ බලතල ප්‍රකාරව ජනාධිපති සිරිසේන මහතා විසින් නිකුත් කරණු ලැබුවක් වෙයි. එහි ප්‍රතිඵලයක් ලෙස අතුරුදහන් වු පුද්ගලයන් පිළිබඳ කාර්යාලය පනතෙහි (1) 2 වගන්තිය ප්‍රකාරව අතුරුදහන් වු පුද්ගලයන් පිළිබඳව වු කාර්යාලය (OMP) ක්‍රියාත්මක කිරීම සඳහා වු පනතෙහි නෛතික විධිවිධාන දැන් ප්‍රශ්නගත වී ඇත.

ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාමය රාමුව සහ යහපාලනය, නීතියේ ආධිපත්‍යය, ප්‍රජාතන්ත්‍රවාදය සහ සංහිඳියාව උදාකිරීම සඳහා 2015 දී සිදුකළ කැපවීම් සම්පූර්ණයෙන්ම නොසලකා හැරීමක් සේ පෙනෙන මෙම තත්ත්වය පිළිබඳව විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය අපේක්ෂා භංගත්වයට පත් වෙයි. අතුරුදහන් වු තැනැත්තන් පිළිබඳව වු කාර්යාලය (OMP) පිහිටු වීම සහ ක්‍රියාත්මක කිරීම සඳහා වූ නීති සම්පාදනයේ බොහෝ ප්‍රමාදයන් සහ බාධාකයන් පැණ නැගිණි. ඒවාට හේතු වු ආරම්භයේ සිටම කැලැල් වු ක්‍රියාදාමයේ කනගාටුදායක පිළිබිඹුවක්ද මෙම තත්ත්වයන්හි පවතින බව කිව යුතුව ඇත. සත්‍ය සොයා යෑමෙහි තීරණාත්මක පියවරක් වු අතුරුදහන් වු තැනැත්තන් පිළිබඳව වූ කාර්යාලය (OMP) පිහිටුවීම සඳහා කැපවීම විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය විසින් [සතුටින් පිළිගැනීමට යෙදිනි](#) . නමුත් එය පිහිටුවීම තවතවත් සංකීරණ කරන දිගින් දිගටම සිදුවන ප්‍රමාදයන් සහ වැරදි මගින් තමන්ගේ අතුරුදහන් වු සහ සොයාගැනීමට නොහැකි ආදරණියයන් දිගින් දිගටම සොයමින් සිටින දහස් ගණනක්ගේ කනස්සලු සහගත අස්ථීරතාවය වඩවඩාත් උග්‍රකරවයි. මෙම තත්ත්වය පිළිබඳව කඩිනමින් පිළියම් යෙදීමක් සිදු විය යුතුය.

මෙම වැරදි සහගත සහ අනිසි පියවරයන් නිවැරදි කිරීමට කඩිනම් ක්‍රියාමාර්ග ගන්නා ලෙසත් ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් නියමකොට ඇති කාර්යරාමුව අනුව කටයුතු කරමින් අතුරුදහන් වු තැනැත්තන් පිළිබඳව වු කාර්යාලය (OMP) පිහිටුවීම හා ක්‍රියාත්මක කිරීම සිදුවන බවට සහතික කරන ලෙසත් වු තම මින්පෙර සිදු කළ ඉල්ලීම් නැවැත අවධාරණාත්මක ලෙස සිදුකිරීමට විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය කැමැති වෙයි. මේ සම්බන්ධයෙන් මෙසේ සිදු නොවී සිදුවන්නා වු ඕනෑම දෙයක ප්‍රතිඵලය වනු අත්තේ අතුරුදහන් වු තැනැත්තන් පිළිබඳව වු කාර්යාලයේ සුපිළිපන් බව ප්‍රශ්ණකාරී කරවීම සහ ශ්‍රී ලංකාවේ අතීත නීති උල්ලංඝණයන් සහ දණ්ඩන මුක්තිය පිළිබඳව කටයුතු කිරීමෙහිදි බෙහෙවින් අවශ්‍යව ඇති වැඩ කොටස් අස්ථිරභායකට පත් කිරීමයි.

Centre for Policy Alternatives (Guarantee) Limited | 6/5, Layards Road, Colombo 5, Sri Lanka Tel: ++94112081384, +94112081385, +94112081386 | Fax: +9411 2081388 | Email: info@cpalanka.org | Web: www.cpalanka.org